www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද නාවික අභ්‍යාස ආසියාව තුල ආතතීන් උත්සන්න කරයි

## US naval exercise heightens tensions in Asia

**2010 ජූලි 24**

**ජෝන් චෑන් විසිනි**

උතුරු කොරියාවට ආසන්න ජපන් මුහුදේ පසුගිය 22 දින ආරම්භවූ එක්සත් ජනපද-දකුනු කොරියානු නාවික අභ්‍යාස අඩ දශකයකටත් වැඩි කාලයකට පසුව ඊසානදිග ආසියාව තුල අන්තරායකාරී ආතතීන් ගිනියම්කර ඇති අතර චීනය හා උතුරු කොරියාව යන දෙරටම එයට සිය විරෝධය පලකොට තිබේ.

"අපරාජිත ජීවගුනය" ලෙස නම්කර ඇති අභ්‍යාසය විශේෂයෙන්ම පසුගිය මාර්තු මාසයේ දී නාවිකයන් 46දෙනෙකුගේ ජීවිත අහිමි කරමින් චියෝනාන්හිදී දකුනු කොරියානු යුද නැවක් ගිල්වා දැමූ බවට චෝදනා ලත් උතුරු කොරියාවට එරෙහිව එල්ල කෙරුනි. ප්‍රහාරය සඳහා උතුරු කොරියාව වගකිවයුතු බවට දකුනු කොරියාව පැවැත්වූ පරීක්ෂනයකින් එලඹි නිගමනයෙන් පසුව එක්සත් ජනපදය හා දකුනු කොරියාව එරටට දඬුවම් පැමිනවීමේ ව්‍යායාමයක නිරතව සිටියි.

අභ්‍යාසයට ගුවන් යානා ගෙන යන න්‍යෂ්ටික බලයෙන් යුත් යූඑස්එස් ජෝර්ජ් වොෂින්ටන් නෞකාව ද ඇතුලු එක්සත් ජනපද හා දකුනු කොරියානු යුද නැව් 20ක් නවීන එෆ් 22 ප්‍රහාරක ගුවන් යානා ද ඇතුලු ගුවන් යානා 200ක් හා නාවික භටයන් 8,000ක් පමන සම්බන්ධ වේ. පියෝන්යෑනය විසින් "නොසැලකිලිමත් ප්‍රකෝපකරනයක්" ලෙස හෙලාදැක තිබෙන බලය උරගා බැලීමේ මෙම දැවැන්ත මෙහෙයුම උතුරු කොරියානු නාවික හමුදාවෙන් එල්ල විය හැකි ඕනෑම තර්ජනයකට මුහුනදීමට අවශ්‍ය තරමට වඩා බෙහෙවින් විශාලය.

චීන භූමියට ආසන්න බටහිර කොරියානු අර්ධද්වීපයේ කහ මුහුදෙහි අභ්‍යාසය පැවැත්වෙන බව දකුනු කොරියානු මාධ්‍ය මුලින්ම වාර්තා කලාය. කෙසේ වෙතත් බීජිනය ආරක්ෂාවට සෘජු තර්ජනයක් යයි ඊට කෝපයෙන් ප්‍රතිචාර දැක්වීය. පසුගිය සතියේ චීන විදේශ අමාත්‍යාංශ ප්‍රකාශකයෙක් කියා සිටියේ "චීනයේ ආරක්ෂාවට තර්ජනයක් වියහැකි පරිදි කහ මුහුදේ කෙරෙන කුමන කටයුත්තකට හෝ අපි එකහෙලාම විරුද්ධ වන්නෙමු" යනුවෙනි.

ජපානය ද ප්‍රශ්නයට හොට දමා තිබේ. යූඑස්එස් ජෝර්ජ් වොෂින්ටන් නෞකාවේ සිට ජපන් නිරීක්ෂකයන් සිව්දෙනෙක් අපරාජිත ජීවගුනය අභ්‍යාසයට සම්බන්ධ වන බව එරට නිවේදනය කලාය. 1895-1945 අතර කාලයේ කොරියාවේ මෘග විජිත පාලනයක් පවත්වාගෙන ගිය ජපානය එක්සත් ජනපද දකුනු කොරියානු යුද අභ්‍යාසයකට එහි යුද නිලධාරීන් හවුල්කරවන ප්‍රථම අවස්ථාව මෙයයි.

ප්‍රකෝපකරනය වැඩි දුරටත් පුලුල් කරමින් එක්සත් ජනපදය මූලිකත්වය ගන්නා එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් මධ්‍යස්ථානය අගෝස්තු 16-26 අතර නම් නොකල මුහුදු සීමාවක තවත් එක්සත් ජනපද හා දකුනු කොරියානු යුද අභ්‍යාසයක් පැවැත්වෙන බව උතුරු කොරියාවට නිල වශයෙන් දැනුම් දුන්නේය.

ජූලි 13 දින චයිනා ඩේලි පුවත්පත මෙසේ පලකලාය: "එක්සත් ජනපදය න්‍යෂ්ටික බලයෙන් ක්‍රියාකරන ගුවන්යානා ප්‍රවාහන යූඑස්එස් ජෝර්ජ් වොෂින්ටන් නෞකාව අභ්‍යාසයට සම්බන්ධ කර ගැනීමට තීරනය කලහොත් චීනයේ මහජන විරෝධය තවත් දැඩිවනු ඇත. නෞකාවේ ප්‍රහාරක අර්ධ විෂ්කම්භය රටේ නැගෙනහිර වෙරලටම ලඟාවීමට සමත් වන අතර එය අභ්‍යාසයේ යෙදවීම අන් කිසිවක් නොව චීනයේ දොරකඩට ම එල්ල කල ප්‍රකෝපකරනයකි".

චීන පීපල්ස් ඩේලි පත්‍රයට කථා කරමින් ජෙනරාල් ලුවෝ යුආන් මෙසේ හඬ නැඟීය: "එක්සත් ජනපදය චීනයේ තැන සිටින්නේ නම් එය චීනයට සිය රටේ බටහිර හෝ නැගෙනහිර වෙරලාසන්නයේ මිලිටරි අභ්‍යාසවල යෙදීමට ඉඩදෙනු ඇත් ද? මූලෝපායික පිරික්සුම හා ප්‍රහාරක ගුවන් යානාවල ආරම්භක අත්හදාබැලීම් චීනයට තර්ජනයක් එල්ල කරනු ඇත"යි ඔහු එක්සත් ජනපද දකුනු කොරියානු ඒකාබද්ධ අභ්‍යාසයේ ද්විත්ව අරමුනු පිලිබඳව අනතුරු ඇඟවීය.

ජූනි 03-ජූලි 05 දක්වා විශාල හමුදා භට සංඛ්‍යාවක් සම්බන්ධවූ ජීව ප්‍රහාරක නාවික අභ්‍යාසයක්

චීනය විසින් කොරියානු අර්ධද්වීපයට දකුනේ නැගෙනහිර චීන මුහුදේදී පවත්වන්නට යෙදුනි. පසුගිය අඟහරුවාදා දකුනු කොරියාව සමග පැවැත්වීමට සැලසුම්කල අභ්‍යාස පිලිබඳව එක්සත් ජනපදය නිවේදනය කල අතරතුරදී චීනයේ රාජ්‍ය රූපවාහිනිය සබ්මැරීනයකින් විදින කෲස් මිසයිලයක් ද ඇතුලු වඩාත් මෑතකදී කහ මුහුදේ පැවැත්වූ අභ්‍යාසයන්හි රූප විකාශනය කරමින් කියා සිටියේ එම අභ්‍යාසයේ අරමුන "දිග දුර ප්‍රහාර" එල්ල කිරීම බවයි. පස්සට අඩිය ගන්නවාට වඩා රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රකාශක පී.ජේ. ක්‍රවුලි පසුගිය සතියේ ප්‍රකාශ කලේ චීනයේ විරෝධය නොතකා මෙම වසරේ එක්සත් ජනපදය හා දකුනු කොරියාව පැවැත්වීමට සැලසුම්කර ඇති අනෙකුත් අභ්‍යාස සඳහා ද අවසාන වශයෙන් කහ මුහුද යොදාගන්නා බවයි. "පැහැදිලිවම චීනය කලාපීය බලවතෙක් වීම හා එහි ආකල්පය අපගේ සැලකිල්ලට හා ගෞරවයට පාත්‍ර වෙයි. එහෙත් මෙය වනාහි විවෘත හා අන්තර්ජාතික සමුද්‍රයන් පිලිබඳ කාරනාවකි. ඒවා තීරනය කරන්නේ අප ය, අප පමනි," ඔහු පැවසීය.

තම දකුනු කොරියානු සගයන් හමුවීම සඳහා එක්සත් ජනපද ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස් හා රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් පසුගිය අඟහරුවාදා දකුනු කොරියාවට ලඟාවූහ. ඒකාබද්ධ නාවික අභ්‍යාස නිවේදනය කරන අතරතුරම ගේට්ස් හා ක්ලින්ටන් දකුනු හා උතුරු කොරියාව යන දෙරට අතර යුද මුක්ත කලාපයට ද ගමන් ගත්හ. මෙය ජාතික ආරක්ෂක ප්‍රතිපත්ති පිලිබඳ වගකිවයුතු එක්සත් ජනපද කැබිනෙට්ටුවේ ඉහල පෙලේ නිලධාරීන් දෙදෙනෙක් එකවිටම යුද මුක්ත කලාපයේ සංචාරය කල ප්‍රථම අවස්ථාවයි.

ඒකාබද්ධ ආඥාපති මඬුල්ලේ සභාපති හා එක්සත් ජනපද මිලිටරියේ ඉහලම නිලධාරියා වන අද්මිරාල් මයිකල් මුලන් සිය දකුනු කොරියානු හවුල්කරුවන් සමග සාකච්ඡා කිරීම සඳහා සියෝල් වෙත පැමිනියේය. එක්සත් ජනපද ආඥාපතීන් දකුනු කොරියාවේ තම ඒකාබද්ධ මිලිටරි බලඇනි ක්‍රියාන්විතයන්හි පාලනය අඩුම තරමින් 2075 දෙසැම්බර් වනතෙක් හෝ සියතෙහි රඳවාගනු ඇත. මුලින් එක්සත් ජනපද මිලිටරිය සැලසුම්කොට තිබුනේ ක්‍රියාන්විත අනදීම 2012 වනවිට ආපසු පැවරීමටය.

සංචාරයන්හි අරමුන "දකුනු කොරියාවේ ආරක්ෂාව පිලිබඳ අපගේ කැපවීම අචල එකක්ය යන ප්‍රබල පනිවිඩය උතුරට කලාපයට හා ලෝකයටම යැවීම" බව ගේට්ස් කියා සිටියේය. චීනය ගැන වක්‍රාකාරයෙන් සඳහන් කරමින් ඔහු මෙසේ ද පැවසීය: "සැබවින්ම අපගේ මිලිටරි සන්ධානය අන් කවර කලෙකවත් මෙතරම් ශක්තිමත් නොවූ අතර කුමන ශක්‍ය ආක්‍රමනිකයෙක් හෝ වැලැක්වීමට සමත්ය." කහ මුහුදේ ඒකාබද්ධ අභ්‍යාසය ගැන ද ඔහු ඇඟවුම් කලේය.

උතුරු කොරියාවට එරෙහි නව සම්බාධක ක්ලින්ටන් නිවේදනය කලාය. විස්තර සඳහන් නොකල ද සම්බාධක මගින් උතුරු කොරියාව සතු අමතර විදේශ වත්කම් කැටි කරන බව ද අමතර පුද්ගලයන් විදේශ ගමන්වල යෙදීම නතරකරන බව ද පියෝන්ග්යැං වලට සම්බන්ධ ජාත්‍යන්තර බැංකු ගනුදෙනු මත ග්‍රහනය දැඩි කරන බව හා එක්සත් ජනපදය දකුනු කොරියාවට "දැඩි ආරක්ෂාවක්" සපයනු ඇති බව ද ඇය පැවසුවාය.

දකුනු කොරියාව පිලිබඳ එක්සත් ජනපදයේ දැඩි ස්ථාවරය චියෝනාන්හිදී නැව ගිල්වා දැමීම මත උතුරු කොරියාව හෙලාදැකීම හා අලුතින් දඬුවම් පැමිනවීමේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාව සම්මත කැර ගැනීමට නොසමත්වීම කෙරෙහි දැක්වෙන ප්‍රතිචාරයේ කොටසකි උතුරු කොරියාවට චෝදනා එල්ල කල දකුනු කොරියාවේ පරීක්ෂනයෙන් අනාවරනය කල තොරතුරු පිලිගැනීම චීනය විසින් ප්‍රතික්ෂේප කිරීම හා එක්සත් ජාතීන්ගේ යෝජනාවට සහාය නොදැක්වීම වොෂින්ටනයේ උදහසට හේතුවී තිබේ. අවසානයේදී ආරක්ෂක මන්ඩලය නිකුත් කලේ සභාපතිගේ ප්‍රකාශනයක් පමනි. එය ප්‍රහාරකයා ලෙස උතුරු කොරියාව නම් නොකල නැව ගිල්වීම හෙලාදකින ප්‍රකාශයකි. එය ජූලි මාසයේ මුල නිකුත් කෙරුනි.

උතුරු කොරියාව සිදුකලායයි කියන ප්‍රකෝපකරනයන් "නොදුටුවාක් මෙන් සිටීම" පිලිබඳව චීන ජනාධිපති හූ ජින්ටාවෝට චෝදනා කරමින් ජූනි මාසයේ පැවති ජී 20 සමුලුවේදී ජනාධිපති ඔබාමා එක එල්ලේ චීනය විවේචනය කිරීම එක්සත් ජනපදය හා චීනය අතර පතුලේ දැල්වෙන ආතතීන් පිලිබඳ ඇඟවුමකි කොරියානු අර්ධද්වීපය පිලිබඳ චීන උත්සුකයන් වටහාගතහැකි බව පලකරමින් ඔබාමා මෙසේ පැවසීය: "බැරෑරුම් ලෙස කථාබහ කිරීමට සිදුවන ආකාරයෙන් පියොංයැනය රතු ඉර පැන ගොස් ඇති බව ජනාධිපති හූ හඳුනාගනු ඇතැයි යන්න මාගේ අපේක්ෂාවයි."

උතුරු කොරියාව මුල්කරගෙන එක්සත් ජනපදය හා චීනය අතර පවතින මතභේද වනාහි ආසියාවේ හා ලෝකය මුලුල්ලේම ඔවුන් අතර පවතින පුලුල් එදිරිවාදිකම්වල කොටසකි. චීනයේ ආර්ථික නැඟීම හා නොකඩවා සිදුවන වර්ධනය එක්සත් ජනපදය ඊසානදිග ආසියාවෙන් උපුටා දැමීමට තර්ජනය කරයි. ජපානය දකුනු කොරියාව හා තායිවානය වැනි ප්‍රධාන එක්සත් ජනපද සගයන් සියල්ලෝම චීනය සමග කරන වෙලඳම මත බෙහෙවින් වාරුවී සිටිති. එක්සත් ජනපදය සිය මිලිටරි බලය ප්‍රදර්ශනය කිරීම මගින් එම රටවල් මිලිටරිමය වශයෙන් වොෂින්ටනය මත රැඳී සිටින බව ඔවුන්ට සිහිපත් කරයි.

ජූලි 22 හා 23 දිනවල වියට්නාමයේ පැවති ඊසානදිග ආසියානු ජාතීන්ගේ (ආසියාන්) සංගමයේ කලාපීය සංසදය තුලින් ද සර්ෂනයන් එලිමහනට පැමිනියේය ආසියාවේ වඩා දැඩි එක්සත් ජනපද පිලිවෙතක් පිලිබඳව ප්‍රමුඛත්වය දරන ක්ලින්ටන් ආසියානු නායකයන් සමග පැවති රැස්වීමේදී මෙසේ පැවසුවාය: "ඇමරිකාවේ අනාගතය ආසියානු පැසිෆික් කලාපයේ සුභදත්වය සමග බැඳී ඇත. එක්සත් ජනපදය පැසිෆික් ජාතියකි. අපි ආසියාන් හා ඔබ සියල්ලන් සමඟ ක්‍රියාශීලී සහකරුවෙක් වීමට කැපවී සිටින්නෙමු". ආසියාන් චීනය ජපානය හා දකුනු කොරියාව ඇතුලත් නැඟෙනහිර ආසියානු සමුලුවට ඇතුලත්වීම සහතික කර ගැනීමෙන් වොෂින්ටනය සුලු රාජ්‍ය තාන්ත්‍රික ජයග්‍රහනයක් ලැබීය.

පියොංයැන් "ප්‍රකෝපකාරී හා අන්තරාදායක ලෙස හැසිරෙන ව්‍යාපාරයක්" ගෙනයන බව පවසමින් ක්ලින්ටන් චියෝනාන්හි නැව ගිල්වීම අරභයා උතුරු කොරියාව හෙලාදකින ලෙස කියා සිටියාය. එම ගුනාංගීකරනය කලාපය තුල ඇමරිකානු ප්‍රතිපත්තියට ද මනාව ගැලපෙන බව පෙනී යයි. එක්සත් ජනපද බලපෑම චීනයේ විරුද්ධත්වය ජයගැනීමට නොසෑහුනු එක්සත් ජාතීන් පිලිබඳ කාරනය සමග සලකන කල ආසියාන් ප්‍රකාශනය සාපේක්ෂව මෘදුය.

හැනෝයි රැස්වීමේ උතුරු කොරියානු නියෝජිතයාවූ බී ටොං ඉල් එලඹෙන මිලිටරි අභ්‍යාසය දැඩි ලෙස හෙලා දුටුවේය. "එවන් පියවරක් කොරියානු අර්ධද්වීපයේ පමනක් නොව කලාපයේම සාමයට හා ආරක්ෂාවට බරපතල තර්ජනයක් එල්ල කරන්නේ යයි" ඔහු පැවසීය එයට "ජීවමාන ප්‍රතිචාරයක්" දැක්වෙනු ඇතැයි ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කලේය.

"කොරියානු අර්ධද්වීපයේ න්‍යෂ්ටික හරනයක් පිලිබඳව එක්සත් ජනපදය අවංකවම උනන්දුවක් දක්වන්නේ නම් එය කථාබහ සඳහා ඇති කැමැත්ත වනසාලන මිලිටරි අභ්‍යාස හා සම්බාධක අත්හිටුවිය යුතුය".

මානව අයිතීන් මුල්කරගෙන චීනයේ සමීප මිතුරෙකු වන බුරුමයට පහර ගැසීම, සිය මූලෝපායික ආසක්තයන් කෙරෙහි විශේෂ සංවේදී බවක් දක්වන්නේ යයි බීජිනය සලකන දකුනු චීන මුහුදේ නිදහස් නාවික ගමනාගමනය සඳහා බලකිරීම වැනි පෙරමුනු ගනනාවකදී චීනයට බලපෑම් කිරීම සඳහා ක්ලින්ටන් සංසදය යොදාගත්තාය. මැද පෙරදිග හා අප්‍රිකාවේ සිට කෙරෙන චීනයේ නාවික තෙල් ප්‍රවාහනයේ වැඩි පංගුවක් සිදුවන්නේ මේ ප්‍රදේශය හරහා ය.

දකුනු චීන මුහුදේ මතභේදය තුලට එක්සත් ජනපදයේ හොටදැමීම විශේෂ කොටම ප්‍රකෝපකාරීය මූලෝපායාත්මක පිහිටීමක් සහිත හා දිය යට තෙල් සම්පත් ඇතැයි විශ්වාස කරන කුඩා ගල්පර හා දිවයින් පෙලක් වන ස්ප්‍රැට්ලි දිවයින් සියල්ලටම හෝ ඉන් කොටසකට චීනය, වියට්නාමය, ෆිලිපීනය හා මැලේසියාව යන රටවල් සියල්ල හිමිකම් පාති. චීනයට එරෙහිව වියට්නාමය සමග පෙලගැසෙමින් ක්ලින්ටන් ගැටුමට ජාත්‍යන්තර විසඳුමක් සඳහා කැඳවුම් කලාය. *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය මෙසේ සඳහන් කරයි: "ආතතීන් දුරු කිරීමේ වෑයමක් ලෙස ඉදිරිපත් කල ද මෙම පියවර සැලකිය හැක්කේ චීනයට කල තියුනු තරවටුවක් ලෙස ය."

එය වැඩි දුරටත් මෙසේ සඳහන් කරයි. "ප්‍රශ්නයට පරිපාලනයේ මැදිහත්වීම පෙන්නුම් කෙරෙන්නේ චීනය අමාරුවේ දැමීම හා එක්සත් ජනපදය හා දකුනු කොරියාව එක්ව මේ සති අන්තයේ ඇරඹීමට යන නාවික අභ්‍යාස අරභයා දැනටමත් විරසකව සිටින අවස්ථාවක චීන විදේශ ඇමති යැන් ජීචි කෝපගැන්වීමයි. ආරක්ෂක රැස්වීමට සහභාගීවූ රටවල් 27 න් 12කම නියෝජිතයෝ දකුනු චීන මුහුදේ ප්‍රශ්නය කෙරෙහි නව ප්‍රවිෂ්ටය අගය කරමින් කථාකිරීමේදී ඇමරිකානු වෑයම පලදරන බව නිරීක්ෂනය කිරීමට යැන් මහතා පෙලඹවීය.

ආසියාන් රැස්වීමේ ප්‍රථම දිනයේදී ඔබාමා පරිපාලනය නිවේදනය කලේ දේශීය විරෝධය මෙන්ම බෙදුම්වාදී ව්‍යාපාර මැඩීමට ඉන්දුනීසියානු මිලිටරි ජුන්ටාව මුදාහැර ඇති කොපාසුස් විශේෂ බලකායන් සමඟ මිලිටරියට-මිලිටරිය යන ආකාරයේ සම්බන්ධතා ආරම්භ කරන බවය. ඉන්දුනීසියාව ප්‍රජාතන්ත්‍රවාදයට පිවිසී ඇති බැවින් තවදුරටත් තහනම පවත්වාගෙන යාම අනවශ්‍ය බවයි.

එහෙත් *වොෂින්ටන් පෝස්ට්* පුවත්පත තවත් හේතුවක් ඉදිරිපත් කරයි. එහි මෙසේ සඳහන් වේ. "ප්‍රචන්ඩ ක්‍රියා හා ඝාතන සම්බන්ධයෙන් ඉන්දුනීසියාවේ විශේෂ බලකායන්ගේ ඉතිහාසය අමතක කර එය සමග සම්බන්ධතා ගොඩනගන බවට බ්‍රහස්පතින්දා ඔබාමා පරිපාලනය නිකුත් කල නිවේදනය චීනයේ නැගීමට එරෙහිව වැට බැඳීමක් ලෙස නැගෙනහිර ආසියාව සමග බැඳීම් ශක්තිමත් කිරීමට එක්සත් ජනපදය මෙතෙක් ගෙන ඇති වඩාත්ම වැදගත් පියවර වන්නේය. විශේෂයෙන්ම මානව අයිතීන් වැනි ආතති සහගත ප්‍රශ්න මත චීනය සමග පරිපාලනයේ ඇයි හොඳයිකම්වල ස්වරය උච්ච අවස්ථාවකට සම්පාත වෙමින් තිබිය දී මෙම තල්ලුව සිදුවිය. චීන බලධාරීන් සමඟ මෑතකදී සිදුවූ කථාබහ හා අන්තර් ක්‍රියාකාරකම්වල දී පූර්වයෙන් පැවති ඉවසීමේ හා සාවධාන වීමේ පරිපාලනයෙහි ප්‍රවිෂ්ටය අතහැර දමා තිබේ.

© www.wsws.org